# සඳැස් කවියට අත්වැලක්



ආචාර්ය
ඥානතිලක හේවාගමගේ

මෙම ලිපි පෙළේ මුල් කොටස් දෙකෙහි දී මාත්‍රා සහ මාත්‍රා ඡන්දස ගැනත්, ගණ සහ ගණ ඡන්දස ගැනත් සැකෙවින් කරුණු විමර්ශනය කළෙමු. මෙම කොටසේ දී අපි බලාපොරොත්තුවන්නේ සිංහල සඳැස් කවියේ ඉතාමත් ජනප්‍රිය ආකෘතියක් වන 'සිවුපද විරිත්' පිළිබඳව සලකා බැලීමටයි.

සිංහල ඡන්දස් ක්ෂේත්‍රයේ ගී, සිවුපද, සිලෝ, දෙපා, සැහැලි, වන්නම්, අවදානම් ආදී වශයෙන් විවිධ ආකෘතීන් වේ. මින් ගී, සිවුපද සහ සිලෝ යන ආකෘති ප්‍රධාන ස්ථායක් ගනී. මෙයිනුත් සිවුපද ආකෘතිය, විශේෂයෙන්ම මෑත ඉතිහාසයේ සඳැස් කවීන් අතර වඩාත්ම ප්‍රචලිත වූ ආකෘතියක් විය. 'එළු සඳැස් ලකුණ' පොතෙහි සිවුපද ලකුණු දක්වන්නේ මෙසේය.

## තෙවැනි කොටස

# සිවුපද විරිත්

"ගණ සකි වසම් කිසි - එම මත් සම කරත් හොත්,
සම එළි විරම්පද වුව - සිවුපද නමැයි දන්නේ."

කිසියම් විරිතක් ගණ වශයෙන් හෝ වර්ණ සංඛ්‍යාවෙන් හෝ විෂම වුවද, සිවුපදයෙහිම එළි සම කොට, විරාම හෙවත් යති ස්ථාන සමාන කොට සහ එක් එක් පාද මාත්‍රා සංඛ්‍යාවෙන් සමාන කොට බැඳීම සිවුපදයෙහි සාමාන්‍ය ලක්ෂණයි.

මෙහිදී එළි යනුවෙන් සඳහන් කරන්නේ පද්‍ය පාදයක ඉඩ ස්ථානයයි. එය පිහිටන්නේ සාමන්‍යයෙන් පද්‍ය පාදයක පාදන්තයේය. මේ අනුව සිවුපදයක පාද සතරෙහිම කෙලවර සම විය යුතුය. එනම් එකම අකුරක් තැබිය යුතුය. මෙලෙසම පාද මධ්‍යයෙහිද සමාන අක්ෂර යොදා සම කරන අවස්ථා ඇත. එවැනි තැන්ද එළි ලෙස හඳුන්වයි.

විරාම හෙවත් යති ස්ථාන වශයෙන් හඳුන්වන්නේ පද්‍ය පාදයක නැවතුම් ස්ථාන වේ. ශ්‍රවන මාධූර්යය සඳහා එම විරාම සුදුසු ස්ථානවල තැබිය යුතුය. සාමාන්‍යයෙන් සිවු-පදයක සියලු පාදයන්ගේ අන්තයෙහි විරාමය හෙවත් යතිය තැබිය යුතුය. මේ පිළිබඳව තවත් නියාමයෝ වෙති. ඒවා පසු අවස්ථාවලදී සාකච්චා කරනු ඇත.

සිවුපදයන් හි එක් පාදයක ඇති ගණ, ගුරු/ලඝු, වර්ණ සංඛයා අනික් පාදයන්ට වඩා වෙනස් විය හැක. එහෙත් පාද සතරෙහිම එක සමාන මාත්‍රා ගණන් තිබිය යුතුය. 'සුභාෂිතය' පොතෙහි එන පහත දැක්වෙන කවිය විමසා බලමු.

පබඳ කිවින් බැඳි කවි රසෙහි විසිතුරු
සබඳ විදු දනෝ පළ කෙරෙති දිය තුරු
නොමඳ රසින් දිවයුරු පොබයයි තඹුරු
සුවඳ දිග තැ විහිදයි හමන මඳ මරු

පළමු පාදයː
න ගණ, ජ ගණ, න ගණ, න ගණ, න ගණ, ලඝුවක් - (මාත්‍රා 17)
දෙවන පාදයː
න ගණ, න ගණ, බ ගණ, න ගණ, න ගණ, ලඝුවක් - (මාත්‍රා 17)
තෙවන පාදයː
න ගණ, ජ ගණ, න ගණ, ස ගණ, න ගණ - (මාත්‍රා 17)
සිව්වන පාදයː
න ගණ, න ගණ, ස ගණ, න ගණ, න ගණ, ලඝුවක් - (මාත්‍රා 17)

මේ අනුව ඉහත සඳහන් කවියේ එක් එක් පාදය ගණ වශයෙන් හෝ වර්ණ සංඛ්‍යාවෙන් හෝ අසමාන වේ. නමුත් පාද හතරම සම මත් වෙති. එළි සම වෙති. විරාම ස්ථාන සමාන වෙති. එනිසා මෙය සිවුපද විරිතකට අයත් වේ.

මෙලෙසම අපේ ජනවහරේ පැවත එන ජන කවියක් ගැනද සලකා බලමු.

තන්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා
කටු කැලේ ගාලෙ නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව් කළ ගොනො ඇදපන් හපුතල් යනවා

පළමු පාදයː
ර ගණ, බ ගණ, ය ගණ, ස ගණ - (මාත්‍රා 18)
දෙවන පාදයː
න ගණ, ත ගණ, ස ගණ, න ගණ, ලඝුවක් සහ ගුරක් - (මාත්‍රා 18)
තෙවන පාදයː
න ගණ, ත ගණ, ස ගණ, න ගණ, ලඝුවක් සහ ගුරක් - (මාත්‍රා 18)
සිව්වන පාදයː
බ ගණ, න ගණ, ජ ගණ, ජ ගණ, ලඝුවක් සහ ගුරක් - (මාත්‍රා 18)

මේ අනුව මෙම කවියේද එක් එක් පාදය ගණ වශයෙන් හෝ වර්ණ සංඛ්‍යාවෙන් හෝ සමාන නොවේ. නමුත් පාද සතරම සම මත් වෙති. එළි සම කර ඇත. යති ස්ථානද සමාන වේ. එනිසා මෙයද සිවුපද විරිතකට අයත්ය.

මාත්‍රා ගණන වෙනස්වීම අනුව සෑදෙන සිවුපද ඡන්දස් 14 ක් සහ එයට අදාලව ගොඩනැගුන සිවුපද විරිත් රාශියක් පිළිබඳව විස්තර 'එළු සඳැස් ලකුණ' පොතෙහි දැක්වේ. එය පහත සඳහන් ගී දෙකෙන් විස්තර කෙරේ.

"ගුරෙක් දෙමත් පටන් - තුදුස් ගුරු විසිඅට මත්,
කෙළ දනු සඳැස් පිළිවෙළ - මෙසයින් නම් සිවුපෙදේ."

ගුරක් හෝ මාත්‍රා දෙකක් පටන් ගුරු දාහතරක් හෝ මාත්‍රා විසි අටක් දක්වා පාදයන් ඇති සිවුපද පිළිබඳ ඡන්දස්වල නම් මෙලෙසින් දැක්වේ.

"සඳ සිරි මැදුම් නම් - පිහිටි සුපිහිටි උතු නම්,
සෙල් ගජ රැඳි රවුළු නම් - තෙනෙත් හිරු මී මදු නම්."

මෙම ඡන්දස් පිළිවෙලින් සඳ, සිරි, මැදුම්, පිහිටි, සුපිහිටි, උතු, සෙල්, ගජ, රැඳි, රවුළු, තෙනෙත්, හිරු, මී, සහ මධු නම්වේ. එලෙසම මෙහි සඳහන් නොවන වෙනත් ඡන්දස් අති විශාල ප්‍රමාණයක් ඇති බවද මෙම පොතෙහි දක්වා ඇත.

මාත්‍රා ගණන, ඡන්දස් නාමය සහ වෘත්ත සංඛ්‍යාව පහත වගුවෙන් දත හැක (ඉහත සඳහන් සියලුම ඡන්දස්වලට අදාලව මෙම වගුව සම්පූර්ණ කර නොමැත).

| මාත්‍රා ගණන | ඡන්දස් නාමය | වෘත්ත සංඛ්‍යානය |
|---|---|---|
| 1 | සඳ | 1 |
| 2 | සඳ | 2 |
| 3 | සිරි | 3 |
| 4 | සිරි | 5 |
| 5 | මැදුම් | 8 |
| 6 | මැදුම් | 13 |
| 7 | පිහිටි | 21 |
| 8 | පිහිටි | 34 |
| 9 | සුපිහිටි | 55 |
| 10 | සුපිහිටි | 89 |

(මූලාශ්‍රය - එළු සඳැස් ලකුණ)

මෙහිදී මාත්‍රා ඡන්දස් දෙකක් දෙකක් එක නාමය ගන්නා බව පෙනේ. මේ ආකාරයට මාත්‍රා ගණන වැඩිවන විට එන අනෙකුත් ඡන්දස් නාම සහ ඒවායේ වෘත්ත සංඛ්‍යාන අපට ගොඩනගා ගත හැකිය.

මාත්‍රා දෙකක් ඇති ඡන්දස, 'සඳ' ඡන්දස ලෙස දැක්වුවද ගුරකින් (ඒකාක්ෂරයකින්) පමණක් සිවුපදයක් ලිවිය නොහැක. නමුත් ලඝු දෙකක් සම්බන්ධ කර 'සඳ' ඡන්දසට අයත් මාත්‍රා දෙකක සිවුපද මෙලෙස ලිවිය හැක.

(1) දන - මන
ගැන - දැන

(2) පැන - එන
ගන - වන

එසේ වුවද 'එළු සඳැස් ලකුණ' ග්‍රන්ථයෙහි මෙවැනි විරිතක් ගැන සඳහන් නොවෙයි. නමුත් මෙවැනි විරිත් 'නොඅනුදත් විරිත්' ලෙස සමහරක් පොත පතෙහි සඳහන්ය.

'සිරි' ඡන්දසෙහි එන ලඝුවකින් සහ ගුරකින් බැඳි (මාත්‍රා තුනකි) විරිත 'බිඳු' විරිත වන අතර එයට උදාහරණ පහත දැ-ක්වේ.

(1) දැනේ - අනේ
දිනේ - දිනේ

(2) අනේ - පනේ
තනේ - පෙනේ

('බිඳු' විරිතට උදාහරණයක් ලෙස හාස්‍ය මුල්කොට ගනිමින් ඉහත කවිය පද බැඳ ඇත්තේ සිංහල භාෂාව පිළිබඳව ඉතාමත් ප්‍රසිද්ධ විද්වතෙකු සේම කවියෙකු වූ කෙනෙකු විසිනැයි ජනප්‍රවාදයේ සඳහන් ය.)

(3) අතේ - සතේ
නැතේ - පුතේ

'සිරි' ඡන්දසෙහි එන ලඝු සතරකින් (මාත්‍රා සතරකි) බැඳි 'මියුලු' විරිතට උදාහරණ පහත දැක්වේ.

(1) මෙ සතර - නම කර
මෙ සසර - දුරු කර

(2) හිරිහැර - කරදර
සිදුකර - සිරකර

'සිරි' ඡන්දසෙහි එන පාද සතරම 'ස ගණය' වන 'තලා' විරිතට උදාහරණ පහත දැක්වේ. එක් පාදයක අකුරු තුනකි.

(1) කෙවු ලී - සර ලී
එ ම ලී - මැ සි ලී

(2) වඳිනා - පුදනා
සුදනා - දකිනා

(3) නැගෙණී - තුටිණී
සැපෙණී - පෙමිණී

'මැදුම්' ඡන්දසෙහි එන මාත්‍රා පහකින් යුත් විරිතක් එළු සඳැස් ලකුණෙහි දක්වා නැත. නමුත් පහත දැක්වෙන අයුරු 'නො-අනුදත් විරිත්' ලෙස කවි පැබැඳිය හැකිය.

(1) පුරන් නේ - පෙරුම් නේ
ලබන් නේ - සැපක් නේ

(2) කුස ගිනට - හඬන විට
දුක සිතට - දැනුණී මට

'මැදුම්' ඡන්දසෙහි එන මාත්‍රා සයකින් බඳින ලද 'අතිඋනු' විරිතට උදාහරණ පහත දැක්වේ.

(1) හතර වටේ - බිඳිල වැටේ
දියුණ රටේ - මකර කටේ

(2) පිපෙන කුසුම් - රකින සිතුම්
තිබෙන පැතුම් - වෙනව උතුම්

කෙසේ නමුත් මෙලෙස අඩු මාත්‍රා සහිත විරිත්වලින් පබැඳුනු කවි, සිංහල සිවුපදයේ එතරම් ජනප්‍රිය නොවුණ බව පැහැදිලිය. සිංහල සිවුපද කවියේ වඩාත්ම ජනප්‍රිය වූ විරිත් ඇතුලුව අනෙකුත් සුවිශේෂ විරිත් පිළිබඳව විස්තර ඉදිරි කො-ටස්වල දී බලාපොරොත්තුවන්න.